සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

43 | S | I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය .............................

## ක්‍රිස්තු ධර්මය I

කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයකට 1,2,3,4,5 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ලකුණු කරන්න.**

01. නව ගිවිසුම තුළ ශුභාරංචියක් යනු

i. ජේසුස් වහන්සේගේ ජීවිත කථාව ගොඩනගා ඇති කෘතියකි.

ii. යහපත් දිවි පැවැත්මට මඟ පෙන්වන කෘතියකි.

iii. ජේසුස් වහන්සේගේ ජීවිතයේ තෝරාගත් සිද්ධි කීපයක් ඇසුරෙන් ලියන ලද දේව ධාර්මික කෘතියකි.

iv. ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසු ලියූ කෘතියකි.

v. ශුද්ධාත්ම ආගමනයෙන් පසු මුල් කිතුනු සභාව අන්‍ය ජාතීන් වෙත ලියන ලද දේව ධාර්මික කෘතියකි.

02. ශුද්ධ වූ පාවුළුතුමාගේ සංදේශ වලට අයත් හසුනක් ලෙස දක්වන්නේ,

i. හෙබ්‍රෙව් හසුන ii. ජාකොබ් හසුන iii. 1 ජොහාන් හසුන

iv. ජුද් හසුන v. 1 තිමෝති හසුන

03. ශුද්ධ ලියවිල්ල ග්‍රීක පරිවර්තනයට ලක් වුයේ කිනම් සියවසේද

i. ක්‍රි. පූ. 3 වන සියවසේදී ii. ක්‍රි.පූ. 5 වන සියවසේදී iii. ක්‍රි.පූ. 9 වන සියවසේ දී

iv. ක්‍රි.ව. 6 වන සියවසේදී v. ක්‍රි.පූ. 2 වන සියවසේදී

04. පලස්තීන භූගෝලීය පසුබිම හදාරන අපට ඉතාමත් සාරවත් හා ජනාකීර්ණ ප්‍රදේශයක් ලෙස දක්නට ලැබෙන වෙරළ බඩ තීරුවට අයත් මිටියාවතක් වන්නේ,

i. ෂාරෝන් මිටියාවතය ii. අක්කෝ මිටියාවතය iii. පිලිස්ති මිටියාවතය

iv. හාරාන් මිටියාවතය v. එන්ඩ්‍රාලෝන් මිටියාවතය

05. ගිවිසුම් කරඬුව ජෙරුසලමට ගෙන ඒමෙන් ජෙරුසලම දේශපාලන වශයෙන් පමණක් නොව ආගමික වශයෙන් ද වැදගත් වූ රජ සමය වන්නේ,

i. සාවුල් රජතුමාගේ පාලන සමය ii. රෙහෙබෝවන් රජතුමාගේ පාලන සමය

iii. සමමොන් රජතුමාගේ පාලන සමය iv. දාවිත් රජතුමාගේ පාලන සමය

v. සාවුල්ගේ පුත් ඊෂ් - බෙෂෙක්ගේ බලය සමය

06. මහ ඇලෙක්සැන්ඩර් අධිරාජ්‍යයා ක්‍රි.පූ. 333 දී පලස්තීනය ආක්‍රමණය කිරීමේ සිට ක්‍රි.පූ. 63 දී රෝම සේනාධිපතියා වූ පොම්පේගේ ආක්‍රමණය දක්වා වූ කාලය සලකනු ලබන්නේ,

i. පර්සියානු යුගය ii. රෝම යුගය iii. අසිරියානු විප්‍රවාසය යුගය
iv. හෙරෝදගේ පාලන යුගය v. ග්‍රීක යුගය

07. දේව විශ්වාසයට මුල් තැන දීම කැපීපෙනෙන ලක්ෂණයක් ලෙස දක්නට ලැබෙන සම්ප්‍රදාය වන්නේ,

i. යාවේ සම්ප්‍රදාය ii. එලොහිම් සම්ප්‍රදාය iii. ද්විතීය නීති සම්ප්‍රදාය
iv. පූජක සම්ප්‍රදාය v. වාචික සම්ප්‍රදාය

08. එලොහිම් සම්ප්‍රදාය තුළ ඒක දේවවාදය ආරක්ෂා කිරීමේ තියමුවාණන් ලෙස දක්වන්නේ,

i. දාවිත් රජතුමා ය ii. දෙවියන් වහන්සේ ය iii. දිවැසිවරයා ය
iv. මෙසියස්තුමා ය v. ආබ්‍රහම්තුමා ය

09. ශුද්ධ බයිබලයේ අඩංගු වන මිනිසා ලබන උතුම් ම තිළිණය වන්නේ,

i. විශ්වය ආරම්භ වූ ආකාරය ii. මිනිසාගේ පාපය වර්ධනය iii. මෙසියස්තුමාගේ උපතයි
iv. ගැලවීමේ පණිවිඩය v. මැවිල්ල ආරක්ෂා කිරීම

10. උත්පත්ති පොතට අනුව පුරාණ බටහිර ආසියාවේ මුල්ම කර්මාන්තය ලෙස දක්වන්නේ,

i. කෘෂිකර්මාන්තය ii. වඩු කර්මාන්තය iii. ගඩොල් කර්මාන්තය
iv. ලෝහ කර්මාන්තය v. කුඹල් කර්මාන්තය

11. මැවිල්ලක් වූ මනුෂ්‍යයා මැවුම්කාර දෙවියන් වහන්සේගේ අයිතිය තමන් වෙත පවරා ගැනීමට දරන ප්‍රයන්තය බයිබල් කතුවරයා පෙන්වා දෙන්නේ,

i. කායින් තම සහෝදර අබෙල් මරා දැමීම
ii. හොඳ නරක අවබෝධ කර ගැනීමේ ගසෙන් අනුභව කිරීම
iii. නෝවා හා ජල ගැල්ම ඇති කිරීමේ සිද්ධිය.
iv. මිනිසා විසින් ගොඩනැගූ බාබෙල් කොත සෑදීම
v. දෙවියන් වහන්සේ මැවූ මිනිසා දස පනත ප්‍රතික්ෂේප කිරීම

12. මෝසෙස්තුමා දිවැසිවරයකි. එතුමා දිවැසිවර පණිවිඩය ඉදිරිපත් කිරීමේදී භාවිතා කළ වාග් මාලාව වන්නේ,

i. සමිදාණන් වහන්සේගේ පණිවිඩය මේය
ii. සමිදාණන් වහන්සේ මෙසේ වදාරණ සේක
iii. සමිදාණන් වහන්සේගේ පණිවිඩය ................ වෙතට පැමිණියේය.
iv. මෙසේ පවසන්නේ සමිදාණන් වහන්සේ වන මමය.
v. සමිදාණන් වහන්සේ මා මගින් ප්‍රකාශ කරන සේක

13. යෙසායා දිවැසිවරයා ඉදිරිපත්කරන මෙසියස් වහන්සේගේ සුලක්ෂණයක් වන 'ප්‍රතාපවත් දෙවිතුමාණෝය' යන්නෙන් ප්‍රකාශ වන්නේ,

i. මිනිසාට මඟපෙන්වීමක් කළ හැකි දේව ප්‍රඥාවෙන් පූර්ණ උත්තමයෙක් බවය.
ii. මෙසියස් වහන්සේ දේව අධිකාරි බලයෙන් සන්නද්ධ බවය.
iii. සදාතනික රාජ්‍යයේ සදාතන පියාණන් වූයේ මෙසියස් වහන්සේ බවය.
iv. මෙසියස් වහන්සේ දාවිත් රාජවංශයේ පෙළපත් උරුමය ලබන බවය.
v. මෙසියස් වහන්සේ යුක්තියෙන්ද ධාර්මිෂ්ට කමින්ද රජකම් කරන බවය.

14. යෙසායා දිවැසිවරයාගේ තොල් පවිත්‍ර කරනු ලැබීම දිවැසිවර කැඳවීමේ දේව ධාර්මික ව්‍යුහයේ කුමන ලක්ෂණයට අයත්වේද?

i. දේව දර්ශනය හෝ විශේෂ අත්දැකීම

ii. දූත මෙහෙවර පැවරීම

iii. ගැලවීම භාර ගැනීමට දිවැසිවරයා මැලිවීම

iv. දෙවියන් වහන්සේ විසින් දිවැසිවරයා ධෛර්යවත් කරනු ලැබීම

v. දිවැසිවරයා යවනු ලැබීම

15. එසකියල් දිවැසිවරයා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. පාලන පන්තියට අයත් වූ පුද්ගලයකු බව විශ්වාස කෙරෙයි.

ii. යහපත් දේ ගොඩ නැගීමටත් අයහපත් දේ සුනු විසුනු කිරීමටත් යවනු ලබයි.

iii. දර්ශන, උපමා හා සංකේත මගින් දිවැසි පණිවිඩ ප්‍රකාශ කරයි.

iv. සැඟවූ අසාධාරණත්වය ගැන දැඩි ලෙස කතා කරයි.

v. නීතිය හෙවත් අනපනත් කෙනෙකුගේ හොඳ නරක මනින මිනුම් දණ්ඩයක් නොවන බව දක්වයි.

16. ජෙරුසලමේ ශ්‍රී විභූතිය ගැන ප්‍රසංසා කිරීමට විශේෂයෙන් වන්දනා ගමන්වලදී භාවිත වූ ගීත හඳුන්වන්නේ,

i. ප්‍රඥා ගීත නමින් ය. ii. රාජකීය ගීත නමින් ය. iii. තුති දීමේ ගීත නමින් ය.
iv. ප්‍රසංශා ගීත නමින් ය. v. සියොන් ගීත නමින් ය.

17. ඊශ්‍රයෙල් ජාතියේ පුනර්ජීවනය වන බලාපොරොත්තු ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ,

i. දානියල් ii. ආමොස් iii. ජෙරමියා iv. එසකියල් v. හොසියා

18. මෙසියානික සංකල්පය ගැන කතා කරන දිවැවරුන් තිදෙනකු වන්නේ,

i. යෙසායා, මීකා, සෙකරියා ii. යෙසායා, ජෙරමියා, සෙකරියා

iii. යෙසායා, හොසියා, ආමොස් iv. යෙසායා, ජෙරමියා, එසතියල්

v. යෙසායා, එසකියල්, මීකා

19. ජුදෙව් ජන සමාජය තුළ ජාති ද්‍රෝහි කණ්ඩායමක් ලෙස සලකනු ලබන්නේ,

i. රෝහීන් ii. වහලුන් iii. විනයධරයන්

iv. අයකැමියන් v. සමරිතානුවරයන්

19. තම පළමු ලිපියෙන් 'මාගේ පුත්‍ර මාර්ක්' යනුවෙන් සඳහන් කරන්නේ,

i. ශු. පාවුළුතුමාය ii. ශු. ජුවාම් තුමාය iii. ශු. පේදුරුතුමාය

iv. ශු. ජාකොබ්තුමාය v. ශු. ජුද් තුමාය

21. (මතෙව් 5:1 මතෙව් 28:18 - 20) පාඨය අනුව මතෙව්තුමා ජේසුන් ස්වාමින් වහන්සේව ඉදිරිපත් කරන්නේ

i. අසහාය ගුරුවරයා නැතහොත් දහම් ඇදුරාණන් ලෙසය.

ii. මාර්ගය ද සත්‍යයද ජීවනයද වන ලෙසය.

iii. දේවපුත්‍රභාවය ඇති එකම තැනැත්තා ලෙසය.

iv. මානව දයාවෙන් හා කරුණාවෙන් පිරි උතුම් මිනිසකු ලෙසය.

v. ස්වර්ග රාජ්‍යයේ දොරටුව ලෙසය.

22. නව ගිවිසුමේ ගැලවීමේ ඉතිහාසය එළිදක්වන ග්‍රන්ථය වන්නේ,

i. ශු. ලුක්තුමාගේ සුභාරංචිය

ii. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතය

iii. ශු. පාවුළුතුමාගේ කොලොස්සි හසුනයි

iv. ශු. ජොහාන්තුමාගේ සුභාරංචියයි

v. එළිදරව්ව ග්‍රන්ථයයි

23. පාවුලුතුමා දෙවන වරටත් රෝමයේ සිරගතව සිටියදී මරණයට පත්වීමට ආසන්න කාලයේ 'අවසාන කැමැත්ත' ලෙස නම් කරන ලිපිය වන්නේ,

i. පිලමොන්ට ලියන ලද හසුන

ii. තීතස් වෙත ලියන ලද හසුන

iii. තිමෝතියස්ට ලියන ලද දෙවන හසුන

iv. තෙසලෝනිකවරුන්ට ලියන ලද ප්‍රථම හසුන

v. තිමෝතියස්ට ලියන ලද ප්‍රථම හසුන

24. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් දොළොස්දෙනා අතරින් 'නතානියෙල් යන' නාමයෙන් හැඳින් වූ ශ්‍රාවකයා වන්නේ,

i. පිලිප් ii. පේදුරු iii. සෙබදිගේ පුත් ජාකොබ්
iv. බර්තෙලමෙව්ය v. අන්තවාදී සීමොන්

25. 'කයිරොස්' යන ග්‍රීක වචනයේ අර්ථය වන්නේ,

i. පැය හෝ මොහොතයි ii. දේව සැලැස්මයි

iii. සියල්ල නිමාවිය iv. ගැලවීම සම්පූර්ණ වූ මොහොතයි

v. හිස් වූ සොහොනයි

26. ජේසුස් වහන්සේගේ වචන දේව ගෞරවය කෙලසන දේව අපහාසයක් ලෙස සැනෙඩ්‍රින් සභාව පිළිගනිමින් සන්ත්‍රාසය හා දැඩි කෝපය ප්‍රකාශ කරන ජුදා පිළිවෙතක් වන්නේ,

i. කසපහර ලබාදීමය ii. දැඩි කෝපයෙන් බැනවැදීමය

iii. හිස මුඩු කර ගැනීමය iv. තම වස්ත්‍ර ඉරා ගැනීමය

v. මුහුණට කෙල ගැසීමය

27. දෙවියන් වහන්සේ, ක්‍රිස්තුන් වහන්සේව අති උසස් තැනට නංවා උන්වහන්සේට දුන් අග්‍ර නාමය වන්නේ,

i. සුසුමාණෝය ii. ස්වාමීන් වහන්සේය iii. බල පරාක්‍රමයාණෝය

iv. සමිදාණෝය v. ජීවනදායකයාණෝය

28. දෙවියන් වහන්සේ වෙතට යන මාර්ගය ජේසුස් වහන්සේ විසින් විවෘත කරදීම සංකේවත් කරන්නේ

i. හිස් වූ සොහොන ii. උත්ථානය iii. භූමිකම්පාව

iv. දේව මාලිගා තිරයේ දෙකඩවීම v. උකුත් වීම

29. ජුදා සමාජය තුළ එකල භාවිතා කළ ඉහළම වටිනාකම ඇති මුදල් නාමය වන්නේ,

i. රිදී ii. රුපියල් iii. ඩිනාර් iv. රෝම තඹ කාසි v. තලෙන්තුව

30. දිව්‍ය සත්ප්‍රසාදය වහන්සේ ස්ථාපිත කිරීමේ සිද්ධිය වාර්තා කිරීමේදී අන්තියෝකියානු සම්ප්‍රදාය අනුගමනය කලේ,

i. ශු. ලුක්තුමා හා ශු. මාක්තුමාය ii. ශු. මාක්තුමා හා ශු. මතෙව්තුමාය

iii. ශු. ලුක්තුමා හා ශු. පාවුළුතුමාය iv. ශු. මාක්තුමා හා ශු. ජොහාන්තුමාය

v. ශු. මතෙව්තුමා හා ශු. පාවුළුතුමාය

31. ජේසුස් වහන්සේගේ තේජශ්‍රියේ දී දකුණු පස හා වම්පස අසුන් අයදිනු ලැබූ අපෝස්තුළුවරුන් වන්නේ,

i. පේදුරු හා ජොහාන් ii. පේදුරු හා ජාකොබ් iii. පේදුරු හා ඇන්ඩෲ

iv. ජාකොබ් හා ජොහාන් v. ජාකොබ් හා ඇන්ඩෲ

32. දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර අසහාය මැදිහත්කරුවාණෝ ක්‍රිස්තුන් වහන්සේ බව පෙන්වා දෙන ලිපිය වන්නේ,

i. ශුද්ධ වූ පාවුළුතුමා එපීසවරුන්ට ලියන ලද ලිපියයි.
ii. ශුද්ධ වූ පාවුළුතුමා ගලාතිවරුන්ට ලියන ලද ලිපියයි.
iii. ශුද්ධ වූ පාවුළුතුමා රෝමවරුන්ට ලියන ලද ලිපියයි.
iv. ශුද්ධ වූ පාවුළුතුමා තෙසලෝනිකවරුන්ට ලියන ලද ලිපියයි.
v. ශුද්ධ වූ පාවුළුතුමා හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද ලිපියයි.

33. ලෝකාරම්භයේ ජලය මතුපිට දේවාත්මානුභාවය හැසිරීම සිහිපත් කරනු ලබන සිදුවීම වන්නේ,

i. ක්‍රිස්තුන් වහන්සේ මුහුද මත ඇවිදීමේ සිදුවීම.

ii. ක්‍රිස්තුන් වහන්සේ ස්නාපනය ලබාගත් සිදුවීම.

iii. ක්‍රිස්තුන් වහන්සේ කුණාටුව නතර කළ සිදුවීම.

iv. ක්‍රිස්තුන් වහන්සේ කානා නුවර මඟුල් ගෙදර දී වතුර වයින් කළ සිදුවීම.

v. කනානීය ස්ත්‍රියට ජීවන ජලය ලබාදුන් සිදුවීම

34. මාංශය 'අනුභව කිරීම' සඳහා යෙදී ඇති ග්‍රීක වචනය වන්නේ,

i. සෝමා ii. සාර්ක්ස් iii. ත්‍රෝගයින්

iv. ප්‍රොෆේට්ස් v. මතෙටේස්

35. ප්‍රසාද ස්නාපනය දානය කිරීමේදී සෑම කිතුනුවෙක්ම ක්‍රිස්මා තෛලයෙන් ආලේප කරනු ලබන්නේ,

i. ප්‍රජා ප්‍රසාදිවරයෙක්, දිවැසිවරයෙක් හා රජකෙනෙක් ලෙස

ii. ප්‍රජා ප්‍රසාදිවරයෙක්, දිවැසිවරයෙක් හා තේවාචාරිවරයෙක් ලෙස

iii. දිවැසිවරයෙක්, සමාජ සේවකයෙක් හා පූජා ප්‍රසාදිවරයෙක් ලෙස

iv. රජකෙනෙක්, දිවැසිවරයෙක් හා සමාජ සේවකයෙක් ලෙස

v. මැදහත්කරුවෙක්, සමාජ සේවකයෙක් හා දූත සේවයේ පංගුකාරයෙක් ලෙස

36. ගීතාවලියේ දෙවනගීතය රාජභිෂේකයකදී ගයන ලද්දකි. ඒ අනුව 'ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ' යන්නෙන් ප්‍රකාශ වන්නේ,

i. ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බව ප්‍රකාශ කරයි.

ii. ජේසුස් වහන්සේ රජෙක් බව ප්‍රකාශ කරයි.

iii. ජේසුස් වහන්සේ ලෝක පාලකයා බව ප්‍රකාශ කරයි.

iv. ජේසුස් වහන්සේ විමුක්ති දායකයාණන් බව ප්‍රකාශ කරයි.

v. ජේසුස් වහන්සේ හා දෙවියන් වහන්සේ අතර සබඳතාව ප්‍රකාශ කරයි.

37. ජුදෙව්වෝ මෝසෙස්ගේ ව්‍යවස්ථාවටත් දේව මාලිගාවටත් මුල් තැන දුන් නමුත් කිතුනුවෝ ජේසුස් වහන්සේ ඉගැන්වූ පරිදි මූලිකත්වය දුන්නේ,

i. ව්‍යවස්ථාවට වඩා ප්‍රේමයෙන් කටයුතු කිරීමට.

ii. එදිනෙදා සිදු වූ ප්‍රාතිහාර්ය වලට.

iii. වැන්දඹුවන් සඳහා සහනාධාර බෙදාදීමට.

iv. ස්නාවක ජොහාන්තුමාගේ අවවාද වලට.

v. නිරන්තර යාච්ඤාවෙන් ජීවිතයක් ගත කිරීමට.

38. ශුද්ධ වූ සභාව වර්ධනය වුයේ එහි සාමාජික සංඛ්‍යාවෙන් පමණක් නොවන බව පෙන්වා දීමට ගත හැකි ප්‍රධාන ක්ෂේත්‍ර වලින් එකක් වන්නේ,

i. ප්‍රඥාවෙන් වර්ධනය වීම

ii . ඇදහිලිවන්ත ජීවිතය

iii . පරිත්‍යාග ජීවිතය

iv . සමාව දීම තුලය

v . යාච්ඤාවේ ජීවිතය

39. නීරෝගේ දරුණු පීඩය යුගය තුළ ඝාතනය කරනු ලැබූ දෙදෙනෙක් වන්නේ,

i. පේදුරුතුමා හා ජාකොබ්තුමා ය.

ii. පාවුළුතුමා හා මාක්තුමා ය.

iii. පේදුරුතුමා හා පාවුළුතුමා ය.

iv. ස්නාවක ජොහාන්තුමා හා මාක්තුමා ය.

v. ජාකොබ්තුමා හා ස්තේපන්තුමා ය.

40. කිතුනුවන්ට පීඩන යුගයක් වී තිබූ රෝම අධිරාජ්‍යය තුල අධිරාජ්‍යයාගේ පිළිමවලට පුද පූජා ඔප්පු කිරීමට හා ඔවුන් දේවත්වයෙන් පිදීමට කැමැත්ත පල කරමින් ලබා ගන්නා සහතිකය හඳුන්වන්නේ,

i. සැන්හෙන්ඩ්‍රියන්.

ii. ලතරානු.

iii. මකාරියෝ.

iv. ලිබෙලුස්.

v. බිසන්තීනු.

41. කිතුනු ලතින් සාහිත්‍යයේ පියා ලෙස හඳුන්වන්නේ,

i. ශු. අගුස්තීනුතුමා. ii. ශු. අතනාසියස්තුමා. iii. ශු. ජෙරොම් තුමා.

iv. ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශු. සිරිල්තුමා. v. ටර්ටුලියන්තුමා.

42. කොන්ස්තන්තීනු අධිරාජ්‍යයා විසින් ක්‍රි.ව. 325 දී නිසියාවේ දී මන්ත්‍රණ සභාවක් කැඳවීමට අනුමැතිය ගත් ශුද්ධෝත්තම පියනම වන්නේ,

i. අති උතුම් පළවෙනි සිල්වෙස්ටර් ශුද්ධෝත්තම පියතුමා ය.

ii. අති උතුම් සෙලෙස්ටියන් ශුද්ධෝත්තම පියතුමා ය.

iii. අති උතුම් ලියෝ ශුද්ධෝත්තම පියතුමා ය.

iv. අති උතුම් හයවන පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.

v. ඇති උතුම් දහවන පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.

43. පස්වන සියවස තුළ අධිරාජ්‍ය පාලනය දේශපාලන හේතුමත දෙකඩ වීම ආරම්භ විය. 'බිසන්තීන සභාව' ලෙස හැඳින්වූයේ,

i. නැගෙනහිර සභාව. ii. බටහිර සභාව.

iii. රෝම සභාව. iv. වතිකානු සභාව.

v. ක්ලුනි සභාව.

44. විවිධ දිශාවලින් පැමිණි ගෝත්‍රික ආක්‍රමණ රෝම ශිෂ්ටාචාරය බිඳ දැමුවේය. එම ආක්‍රමණ යුගය යුරෝපීය ඉතිහාසය දක්වන්නේ,

i. යුධ සමය. ii. වේදභේදික යුගය.

iii. සභාපිය යුගය. iv. අඳුරු යුගය.

v. පරිත්‍යාගයේ යුගය.

45. 'සුම්මා තියොලොජිකා' යන විශිෂ්ඨ කෘතිය රචනා කරන ලද්දේ

i. ශුද්ධ වූ ඇන්සලම්තුමා ii. ශාන්ත බැසිල් තුමා

iii. ශාන්ත තෝමස් ඇක්වයිනාස් තුමා iv. ශුද්ධ වූ ජෙරොම් තුමා

v. ශාන්ත ඩොමිනික් ගුස්මාන්තුමා

46. අවිලාහි තෙරේසා තුමියගේ යොමු කිරීම හා මඟ පෙන්වීම තුළ කුරුසියේ ජුවාම්තුමා විසින් නොලියූ අධ්‍යාත්මික ජීවිත පිලිබඳ ග්‍රන්ථයක් වන්නේ,

i. කාර්මෙල් පර්වත නැග්ම ii. ආත්මයේ අඳුරු රාත්‍රිය iii. අධ්‍යාත්මික ගීතය

iv. ප්‍රේමයේ ජීවන දැල්ල v. ඇතුලාන්ත මන්දිරය

47. අධ්‍යාත්මික ජීවිතයේ දේව සබඳතාවය අත්දැකීමට බැහැපත්කම නැතුවම බැරිය යන උපදේශනය ජීවිත සාක්ෂියෙන් දරූ කාර්මෙල් නිකායේ - පැවිදි සොයුරිය වන්නේ,

i. ජේසුගේ කුඩාමල වන තෙරේසා තුමිය ii. ක්‍රිස්තුන් වහන්සේ

iii. කල්කටාවේ තෙරේසා තුමිය iv. මරිය ගොරෙත්ති තුමිය

v. හෙලේනා තුමිය

48. දේව ප්‍රසාද නිධාන හතම ක්‍රිස්තුන් වහන්සේ ස්ථාපිත කරනු ලැබූ බව සනාථ කරනු ලබන්නේ,

i. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව

ii. නිසියානු මන්ත්‍රණ සභාව

iii. ජෙරුසලම් මන්ත්‍රණ සභාව

iv. කැල්සිඩොන් මන්ත්‍රණ සභාව

v. ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව

49. ක්‍රි.ව. 1912 අනුරාධපුරයේදී පුරා විද්‍යා කැනීම්වලදී ගල් කණුවක කොටන ලද විශේෂ හැඩයකින් යුත් කුරුසිය සොයාගත් පුරාවිද්‍යාඥයා වන්නේ,

i. සෙනරත් පරණවිතාන මහතා

ii. බී. ආර්. අයර්ටන් මහතා

iii. කොස්මස් ඉන්ඩිකොප්ලෙයුස්ටස් මහතා

iv. අබු සයිදේ මහතා

v. එච්.සී.පී. බෙල් මහතා

50. තෝමස් අපොස්තුළුතුමා ඉන්දියාවට දහම් ප්‍රචාරය සඳහා පැමිණි බවට සාක්ෂි ඇති බවත් ඉන්දියාවේ මලබාරයේ සිට දහම් ප්‍රචාරය සඳහා ගිය බවට ජනප්‍රවාද පවතී. එවැනි ස්ථාන දෙකක් වන්නේ,

i. ලංකාව හා මලක්කාව

ii. ලංකාව හා මාලදිවයින

iii. මාලදිවයින හා මලක්කාව

iv. මලක්කාව හා මදුරාසිය

v. ලංකාව හා මදුරාසිය

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

Second Term Test - Grade 13 - 2019

විභාග අංකය ............................

# ක්‍රිස්තු ධර්මය II

කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

## I කොටස

01. i. කිතුනු සභාවේ පීඩන යුගය තුළ පීඩන ඇති කළ අධිරාජ්‍යවරු දෙදෙනක් නම් කරන්න. (ල. 1 x 2 = 2)

ii. පීඩන යුගය තුළ කිතුනුවන්ට මුහුණ දීමට සිදුවූ පීඩන දෙකක් ලියන්න. (ල. 2 x 2 = 4)

iii. පීඩන යුගයදී එවකට සිටි කිතුනු ජනතාව තුළ දක්නට ලැබූ සුවිශේෂී ලක්ෂණ තුනක් ලියන්න. (ල. 2 x 3 = 6)

iv. වර්තමාන කිතුනු සභාවට එල්ල වන අභියෝග ජයගැනීමට ඔබ ක්‍රියා කරන ආකාර හතරක් ලියන්න. (ල. 2 x 4 = 8) (ල. 2 + 4 + 6 + 8 = 20)

02. i. 16 වන සියවසේ කතෝලික සභාව තුළ ප්‍රතිසංස්කරණයට ලක් වූ තාපස හා පැවිදි නිකායන් දෙකක් ලියන්න.

ii. ඔබ ඉහත සඳහන් කළ නිකායක වැදගත් කරුණු දෙකක් ලියන්න.

iii. ප්‍රතිසංස්කරණවාදී සභාවල ඉගැන්වීමටත්, පිළිතුර දීමටත්, කතෝලික සභාවේ ස්ථාවරය ශක්තිමත් කිරීමටත්, ශු. සභාවේ උන්නතිය සඳහා ක්‍රියා කළ යුත්තේ කෙසේද යන්න සාකච්ඡා කිරීමටත්, කැඳවූ ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව ගත් තීරණ තුනක් ලියන්න.

iv. ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව විසින් ඉදිරිපත් කරන ලද නාවෝදයේ ව්‍යාපෘති වලට අනුව වර්තමාන කිතුනු සභාවේ ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති හතරක් ලියා විස්තර කරන්න. (ල. 2 + 4 + 6 + 8 = 20)

03. i. නව ගිවිසුමට අයත් ජේසුස් වහන්සේගේ ජීවිත සිදුවීම් හා දූත මෙහෙවර පිළිබඳ තොරතුරු ලබාදෙන අති විශේෂ ග්‍රන්ථ දෙකක් ලියන්න.

ii. ශුද්ධ වූ මතෙව්තුමා තම සුවිශේෂය ලිවීමේ පරමාර්ථ දෙකක් ලියන්න.

iii. සමදර්ශක ශුභාරංචි අධ්‍යයනය කරන ඔබට දක්නට ලැබෙන සමානතා තුනක් ලියන්න.

iv. වර්තමාන කිතුනු සමාජය තුළ සිටින ඔබ අන්‍ය ආගමික ජනතාව අතරට සුභාරංචිය රැගෙන යෑමට ක්‍රියාකරන ආකාර හතරක් ලියන්න.

(ල. 2 + 4 + 6 + 8 = 20)

## II කොටස

04. i. ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්ය වර්ග සතර ලියා, ප්‍රාතිහාර්ය මගින් ප්‍රකාශ වන දේ විස්තර කරන්න.

ii. ක්‍රිස්තුන් වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්ය වර්තමාන සභාව තුළ අප අත්දකින ආකාරය කරුණු පහක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 10 x 2 = 20)

05. i. ක්‍රියාපොත මුල් කිතුණු සභාවේ ඉතිහාසය මනාව ඉදිරිපත් කරන ඉතිහාස ග්‍රන්ථයක් බව කරුණු පහක් ඇසුරින් පැහැදිලි කරන්න.

ii. වත්මන් ධර්ම දූත සේවය ඉදිරියට ගෙන යාම සඳහා ක්‍රියාපොත තුළින් කිතුනුවන්ට ඉමහත් පන්නරක් ලැබෙන බව කරුණු පහක් ඔස්සේ පෙන්වා දෙන්න. (ලකුණු 10 x2= 20)

06. i. දිවැසිවර ඉගැන්වීම් යටතේ දිවැසිවර යෙසායා ස්වාමීන් වහන්සේගේ සේවකයා කවුරුන්ද? යන්න ගීත හතරකින් පෙන්වා දෙන ආකාරය පැහැදිලි කරන්න.

ii. ප්‍රසාද ස්තාපනය තුළ ඔබ ලබන දිවැසි කාර්යය වර්තමාන සමාජය තුළ කෙසේ ඉටුකරන්නේද? යන්න කරුණු පහක් ඔස්සේ පෙන්වා දෙන්න. (ලකුණු 10 x 2 = 20)

07. i. මුල් සභාවේ විශ්වාසය ආරක්ෂා කර ගැනීම සඳහා උරදුන් සභා පියවරු පස් දෙනෙක් නම් කර, ඔවුන්ගෙන් සභාවට ඉටු වූ සේවය විස්තර කරන්න.

ii. සභාපියවරුන්ගේ ආකල්ප හා ශුද්ධවන්ත ජීවිතය ආදර්ශයට ගනිමින් වර්තමාන කිතුනු සමාජයේ විශ්වාසය ආරක්ෂා කර ගැනීමට ඔබ ගන්නා පියවර පහක් විස්තර කරන්න. (ලකුණු 10 x 2 = 20)

08. i. හත්වන සියවසේදී රජය හා ශුද්ධ වූ සභාව තුළ දැකිය හැකි වැදගත් කරුණු පහක් ලියන්න.

ii. ජාතික සමගිය හා ආගමික සහජීවනය ගොඩනැගීමට ඔබ දායක වන ආකාරය කරුණු පහකින් පෙන්වා දෙන්න. (ලකුණු 10 x 2 = 20)

## දෙවන වාර පරීක්ෂණය - 2019

## ක්‍රිස්ත්‍රියානි ධර්මය - 13 ශ්‍රේණිය.

## I පත්‍රය

## පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 2 | 21. | 1 | 31. | 4 | 41. | 5 |
| 2. | 5 | 12. | 1 | 22. | 2 | 32. | 5 | 42. | 1 |
| 3. | 1 | 13. | 2 | 23. | 3 | 33. | 2 | 43. | 1 |
| 4. | 2 | 14. | 4 | 24. | 4 | 34. | 3 | 44. | 4 |
| 5. | 4 | 15. | 3 | 25. | 1 | 35. | 1 | 45. | 3 |
| 6. | 5 | 16. | 5 | 26. | 4 | 36. | 2 | 46. | 5 |
| 7. | 1 | 17. | 4 | 27. | 2 | 37. | 1 | 47. | 1 |
| 8. | 3 | 18. | 1 | 28. | 4 | 38. | 2 | 48. | 5 |
| 9. | 4 | 19. | 4 | 29. | 5 | 39. | 3 | 49. | 2 |
| 10. | 5 | 20. | 3 | 30. | 3 | 40. | 4 | 50. | 1 |

(ලකුණු 1X2=100)

## ක්‍රිස්ත්‍රියානි ධර්මය - 13 ශ්‍රේණිය.

## II පත්‍රය

### I කොටස

01. i. නීරෝ අධිරාජ්‍යයා, ඩොමීෂියන් අධිරාජ්‍යයා, ට්‍රෝජන් අධිරාජ්‍යයා, මැක්සිමිනස් අධිරාජ්‍යයා, ඩෙෂියස් අධිරාජ්‍යයා, අවුරේලියස් අධිරාජ්‍යයා, දියොක්ලේසියානු අධිරාජ්‍යයා (ලකුණු 4X5=20) (13 ශ්‍රේණිය 7:2 නිපුනතා මට්ටම)

ii. කිතුනුවන් කැබැලිකොට මරා දැමීම, ගස්වල හා කණු වල බැඳ පිලිස්සීම, රටින් පිටුවහල් කිරීම, දරුණු වන මෘගයින් මැදට විසි කිරීම, හිස ගසා දැමීම, ඇස් උගුල්ලා දැමීම, කුසගින්නේ තබා දැමීම, කිතුනු පොත් වනසා දැමීම.

(ලකුණු 2X2=4) (13 ශ්‍රේණිය 7:2 නිපුනතා මට්ටම)

iii. අභියෝගවලට නිර්භවය මුහුණු දීම, විශ්වාසය සුරකීම සඳහා දැරූ ප්‍රයත්න, අභියෝග හමුවේ විශ්වාසය සවිමත් වීම, පීඩන හමුවේ ශුද්ධාත්ම බලය අත්දැකීම, නිරතුරුවම විශ්වාසයට සාක්ෂි දැරීම.

(ලකුණු 2X3=6) (13 ශ්‍රේණිය 7:2 නිපුනතා මට්ටම)

iv. අන්‍ය ආගමික පරිසරයක කිතු දහම ඇදහීමේ දී මුහුණ දෙන ප්‍රශ්න ගැටළු වලට පලිගැනීමෙන් තොරව ඉවසීමෙන් කටයුතු කිරීම.

2. දූත සේවාවල යෙදෙන විට එල්ල වන බාහිර බලපෑම් සියල්ල විශ්වාසය තුළ යාච්ඥාවෙන් දෙවිඳුන්ට භාරදීම.

3. බයිබල් මූලධර්මවාදීන්ට නිවැරදි දේ පෙන්වා දීමට දේව වචනය හොඳින් හදාරා දැනුවත්ව සිටිය යුතුය.

4. මුල් කිතුනු සභාවේ ලක්ෂණ ඇතිව වර්තමාන කිතුනුවන් සාමය හා ප්‍රිතියෙන් එකතුමුතුව සභාවේ දියුණුව සඳහා කැපවී සේවය කළ යුතුය....ආදී කරුණු තිබේ නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 2 + 4 + 6 + 8 = 20)

02. i. කර්මෙල් නිකාය, කැපුචින් නිකාය, වින්සෙන් තියානු නිකාය, ජේසු නිකාය (ලකුණු 1X2=2)

ii. **කර්මෙල් නිකාය**

අධ්‍යාත්මික ජීවිතය හා භාවානායෝගී යැදුම් පිළිබඳ මොවුන්ගේ අධ්‍යාත්මික නිර්මාණ බොහෝ වැදගත්ය.

කර්මෙල් කන්දෙහි හුදකලා ජීවත් වූ අතර දැඩි තාපය ජීවිතයක් ගත කළහ.

පූර්ණ දිවියකට මඟ, ඇතුලාන්ත මන්දිරය, නැමැති අධ්‍යාත්මක කෘති නිර්මාණ කිරීම.

**කැපුචින් නිකාය**

13 වන සියවසේ ආරම්භ වූ ප්‍රැන්සිස්කානු නිකායෙන් බිහිවූවකි.

ශුද්ධ ලියවිල්ල මත ජීවිත ක්‍රමය නැවත ඇති කරලීමේ අදහසින් මෙම නිකාය බිහිවිය.

දිළිඳු ජීවිත ගත කළහ.

**වින්සෙන්තියානු නිකාය**

දිළිඳුන් කෙරෙහි ගැඹුරු ආදරයක් හා කරුණාවත් දැක්වූහ.

ක්‍රි.ව. 1625 දී වින්සන්ට් ද පාවුලුතුමා විසින් ප්‍රංශයේ ආරම්භ කළහ.

කතෝලික ධර්මය දේශනා කර ප්‍රතිසංස්කරණවාදී ඉගැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීම.

**ජේසු නිකාය**

ලොයාලාහි ශුද්ධ වූ ඉග්නාසියුස්තුමන් විසින් ක්‍රි.ව. 1554 දී ආරම්භ විය.

වේදහාර රැකීම, කැපවූ ජීවිතය, ශුද්ධාත්ම පියතුමාට කීකරුවීම විශේෂ ලක්ෂණ වේ.

කතෝලික සභාවේ ධර්මවේදය උගන්වා ආරක්ෂා කරගැනීම කාර්යය වේ.

(ලකුණු 2X2=4) (13 ශ්‍රේණිය 8.2 නිපුණතා මට්ටම)

iii. ශුද්ධ වූ බයිබලය හා ජීවන සභා සම්ප්‍රදාය යන දෙකම ධාර්මික සත්‍යතාවයන්හි උල්පත බව.

ප්‍රසාද නිධාන හතම ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කරනු ලැබූ බව

පැරණි ගිවිසුම හා නව ගිවිසුම ග්‍රන්ථ සියල්ල දේවානුභාවයෙන් ලියන ලද බව

දේශනා කිරීමේ බලය හා ඉගැන්වීමේ බලය ශුද්ධ වූ සභාවට ක්‍රිස්තුන් වහන්සේ විසින් දානය කරනු ලැබූ බව

(ලකුණු 2 X 3=6) (13 ශ්‍රේණිය 8:2 නිපුනතා මට්ටම)

iv. මරියතුමිය හා ශුද්ධවන්තයන්ට නියමිත පරිදි ගෞරවය දැක්වීම.

දිව්‍ය සත්ප්‍රසාද ලැබීමට උනන්දු කරවීම.

නිතර නිතර සමගි සන්ධානයේ ප්‍රසාද නිධාන ලබා ගැනීමට උනන්දු කරවීම.

දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව හා දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය ලබා ගැනීමට උනන්දු කරවීම.... ආදී කරුණු ක්‍රියාවට නංවන ආකාර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 2 X4=8) (13 ශ්‍රේණිය 8:2 නිපුනතා මට්ටම)

(ලකුණු 2 + 4 + 6 + 8 = 20)

03. i. ශුද්ධ මතෙව්තුමාගේ සුභාරංචිය, ශුද්ධ වූ ලුක්තුමාගේ සුභාරංචිය, ශුද්ධ වූ මාක්තුමාගේ සුභාරංචිය, ශුද්ධ වූ ජොහාන්තුමාගේ සුභාරංචිය. (ලකුණු 1 X2=2) (12 ශ්‍රේණිය 4:2 නිපුනතා මට්ටම)

ii. ජේසුස් වහන්සේ ජුදා ජනතාව අපෙක්ෂාවෙන් සිටි මෙසියස් වහන්සේ බව අවධාරණය කිරීම.

පැරණි ගිවිසුමහි, මෙසියස් වහන්සේ සම්බන්ධ අනාවැකි සියල්ල නව ගිවිසුමහි ජේසුන් වහන්සේ තුලින් පරිපූර්ණ වූ බව

ජේසුන් වහන්සේ අසහාය ගුරුවරයා නැතහොත් දහම් ඇදුරාජණන් ලෙස ඉදිරිපත් කරයි.

(ලකුණු 1 X2=2) (12 ශ්‍රේණිය 4:2 නිපුනතා මට්ටම)

iii. සමදර්ශක කතුවරුන් තිදෙනාව ජේසුස් වහන්සේගේ සේවයට ප්‍රධාන ස්ථානයක් දී තිබීම.

'දේව රාජ්‍යය' යන වචනය තිදෙනාම භාවිතා කර තිබීම.

රෝග සුව කිරීමේ වැනි සමහර සිදුවීම් බෝහෝ දුරට එක හා සමානව ඉදිරිපත් කිරීම.

දුක්ප්‍රාප්තිය, මරණය, උත්ථානය සුභාරංචි තුනේම සඳහන් වීම.

(ලකුණු 2 X3=6) (12 ශ්‍රේණිය 4:2 නිපුනතා මට්ටම)

iv. කිතුනු වටිනාකම් වචනයෙන් නොව ක්‍රියාවෙන් පෙන්වීම.

| | |
|---|---|
| එකිනෙකාව පිළිගැනීම හා ගරු කිරීම | පරිත්‍යාගශීලි බව |
| ආදර්ශමත් ජීවිතය | සරල දිවි පැවැත්ම |
| අසල්වැසියාට ප්‍රේම කිරීම | සහජීවනයෙන් ජීවත් වීම |

යාච්ඥාවේ ජීවිතය ආදී කරුණු ඇතුලත් කොට පෙන්වා දී තිබේ නම් ලකුණු ලබාදෙන්න.

(ලකුණු 2 X4=8)

**II කොටස**

04. i. ස්භාවධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්ය සුවකිරීම්

දුෂ්ට ආත්ම දුරු කිරීම මලවුන් උත්ථාන කිරීම.

(12 ශ්‍රේණිය - 5:1 නිපුනතා මට්ටම)

විශ්වාසයේ පසුබිම තුළ ක්‍රියාත්මක වන ක්‍රිස්තු පෞරුෂය ප්‍රකාශ වීම.

දේව රාජ්‍යයේ උදාව සනිටුහන් වීම

දේව බලය හා ආධිපත්‍ය ක්‍රියාවට නැංවීම

මනුෂ්‍යයා සතර ආකාර වහල්කම් වලට ගොදුරු වී සිටියි. ඔවුන් එම වහල්කම් වලින් ගලවා ගැනීම. (මරණය, ලෙඩරෝග, ස්වභාවික බලවේග, දුෂ්ට ආත්ම) මෙවන් කරුණු ඇතුලත් කොට විස්තර කර තිබීම.

ii. පෞද්ගලික යාච්ඤාවේ ජීවිතය තුලින්, ස්ථිර ඇදහිල්ලේ ජීවිතය තුලින්, පවුල් ජපමාලය තුලින්, දිව්‍ය සත් ප්‍රසාද වන්දනාව තුලින්, දේව වචනය මෙනෙහි කිරීම තුලින් දිව්‍ය සංරක්ෂණ අත්දැකීම බලාපොරොත්තු ඉෂ්ඨ වීම දුෂ්කර ආත්ම සුවවීම, සුවකල නොහැකි රෝග සුවවීම.... ආදී කරුණු වලට සමාන කරුණු ඉදිරිපත්කර තිබේ නම් ලකුණු ලබාදෙන්න.

(ලකුණු 2 x10=20)

05. i. ශුද්ධ පාවුළුතුමා රෝමය සිරගත වීම දක්වා සහා ඉතිහාසය තොරතුරු ක්‍රියා පොතෙහි අන්තර්ගත වේ.

නව ගිවිසුමේ ගැලවීමේ ඉතිහාසය එළිදක්වන ග්‍රන්ථය ක්‍රියා පොතය.

මුල් සභාව තම කාර්යය ඉටුකල අන්දම ක්‍රියා පොතෙහි සඳහන් වේ.

ශුද්ධාත්මයාණන් වහන්සේ පේදුරු හා පාවුළු වැනි අපොන්තුළුවරුන්ගේ ජීවිත හරහා ක්‍රියා කළ අන්දම ඇතුලත්වේ.

ලොව පුරා සුභාරංචිය විශේෂයෙන් උතුරු මධ්‍යධරණී ප්‍රදේශය හරහා වත්මන් සිරියාව තුර්කිය පුරා සුභාරංචිය ව්‍යාප්තිය ක්‍රියාපොතේ ඇතුලත් වේ.

ඉතා කරුණු ඇතුලත් විස්තර කර තිබේ නම් ලකුණු ලබා දෙන්න. (12 ශ්‍රේණිය 4:2 නිපුණා මට්ටම)

ii. පාවුළුතුමාගේ ධර්මදූත චාරිකා හා සේවයට පූර්ණ කැපවීම.

විශ්වාසයයේ ගමනක් යෑම.

පරිත්‍යාගශීලී ජීවිතය

ශුද්ධාත්මකයාන්ගෙන් පූර්ණ වීම.

දේව කැමැත්තට මුලිකත්වය දී ක්‍රියා කිරීම

අභියෝග හමුවේ නොසැලී දේව විශ්වාසයෙන් මුහුණු දීම.

(මෙවන් කරුණු ඇතුලත් කොට පෙන්වා දී ඇත්නම් ලකුණු ලබා දෙන්න. ) (ලකුණු 2x 10 = 20)

- දෙවියන් වහන්සේ අපට බාර දෙන වගකීම් හා යුතුකම් ඉටු කිරීමට ස්වාමීන් වහන්සේගෙන් බලවත් විය යුතුය.
- කාලයේ සලකුණු මගින්. විශේෂ පුද්ගලයන් තුලින් කැඳවීම ලබයි.
- දේව කැමැත්තට අවනත වී කැඳවීම භාර ගැනීම, කිසිවිටක මැලිනොවීම.
- දේව වචනයට පිටු පා කටයුතු කරන අයට දේව වචනය අනුව ජීවත් විය යුතු ආකාරය පහදා දීම.
- දහම් පාසල් වල ඉගැන්වීම, ගිහි දූත සේවාවල යෙදීම, දේව ධර්මය හැදෑරීම, ජනමාධ්‍ය භාවිතය, බයිබල් පාඨමාලා පැවැත්වීම ආදී මගින් ගිහි අපොස්තලික සේවාවල යෙදීම.

(සිසුවා ලියා ඇති කරුණු ගැන සලකා බලා ලකුනු දෙන්න) (ලකුණු 10) (ලකුණු 10 x 2 = 20 යි)

06. i. පළමු ගීතය (යෙසායා 42/1-9)

සේවකය තම කාර්යය ඉටු කිරීමට සඳහා හිංසාකාරී පියවර නොගන්නා බවත් ජාතීන් උදෙසා මැදිහත් වන ඔහු අධෛර්යයට පත් නොවන යුක්තිය ඉටුවනතුරු ඉවසිලිවත්නව ක්‍රියාකරන්නේ කල කිරීමෙන් නොවන බව පෙන්වා දෙයි.

(දෙවන ගීතය - යෙසායා 491-7)

ඊශ්‍රායෙල් ජාතීන්ගේ පුනරුත්තාපනය සඳහා සේවකයා දෙවියන් වහන්සේ තුළ යැපෙයි. සියලු ජාතීන්ට ගැලවීම ගෙන ඒම ඔහුගේ කාර්යය වන අතර ජාතීන්ට ආලෝකයක් ලෙස මඟ පෙන්වීම

තෙවන ගීතය - (යෙසායා 50/4-11)

සේවකයා තුළ ඇත්තේ නොසැලෙන ගැඹුරු විශ්වාසයයි. ස්වාමීන් වහන්සේගේ සේවකයා වේදනා මැද්දේ වුවද දෙවියන් වහන්සේට ඇහුම් කන්දීමට කැමැතිව කීකරුව සිටියි. සියල්ල ඉවසීමෙන් දැන ගනියි.

සිව්වන ගීතය - (යෙසායා 52/13/ - 53/12)

සේවකයා මුහුණු දෙන වද හිංසා සජීව විස්තර කරයි. සේවකයා මිනිස් රූපයකට සමාන නොවන ආකාරයට විරූපී බව නිසාම ප්‍රතික්ෂේප කරනු ලබන බවත් පැහැදිලි කරයි. පව්කාරයන් උදෙසා ඔහු තම ශුද්ධ වූ ජීවිතය පූජා කරන හෙයින් දෙවිඳුණේ ඔහුට ජයග්‍රහණය දෙන සේක. (12 ශ්‍රේණිය 3.2 නිපුණතාවය)

ii. ප්‍රසාද ස්තාපනය ලබන සෑම කිතුනුවෙක්ම පූජක, දිවැසිවර, රාජකීය යන ත්‍රිවිධ කාර්යයට පංගුකාරවීම සඳහා කැඳවීම ලබයි.

කාලයේ සලකුණු තේරුම් ගනිමින් පුද්ගලයෙකු තත්වය , තනතුර, තමාට ලැබෙන ප්‍රතිචාර පවා නොකදා දේව පණිවිඩය ප්‍රකාශ කරන්නකු විය යුතුය.

දේව වචනය ප්‍රකාශ කිරීමට දේව වචනය පිළිබඳ මනා අවබෝධයක් ලබාගත යුතුය.

දේව වචනය අනුව ජීවත්වී තමාට ලැබෙන සෑම අවස්ථාවකදී උපරිම ලෙස ප්‍රයෝජනයට ගනිමින් තම වචනයෙන්, ක්‍රියාවෙන් හා ජීවිතයෙන් දේව වචනය ප්‍රකාශ කළ යුතුය.

සත්‍යයට සාක්ෂි දරමින් යුක්තිය, වෙනුවෙන් පෙනී සිටිමින් සාධාරණත්වය අරඹා කටයුතු කරමින් දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කරන්නෙකු විය යුතුය.

(මෙවැනි කරුණු ඔස්සේ පෙන්වා දී ඇත්නම් ලකුණු ලබාදෙන්න.) (13 ශ්‍රේණිය 6.1 නිපුණතා මට්ටම)

(ලකුණු 10 x 2 = 20 යි)

07. i. ශුද්ධ වූ ජැස්ටින්තුමා, ශුද්ධ වූ අතනාසියස් තුමා, ශුද්ධ වූ ජෙරොම්තුමා, ශුද්ධ වූ සිරිල්තුමා, ශුද්ධ වූ අගොස්තීනුතුමා, ටර්ටුලියන් තුමා

අන්‍ය ආගමික හා ජුදා ආගමිකයින් විසින් කිතුනුවන් පීඩාවට ලක් කිරීමට හේතු නැති බව පෙන්වා දීම.

අන්‍ය ආගමික උගතුන්ට ක්‍රිස්තියානි ධර්මය වඩාගන්නට මග පහදා දීම.

විවිධ සංසයන්හි පැණ ගුණ ප්‍රශ්ව වලට පිළිතුරු ලෙස සභාවේ කාලෝචිත තේමා ඔස්සේ එඩේරික ලිපි ලිවීම.

ක්‍රිස්තියානින් දැනුවත් කිරීම සඳහා දර්ශණ විධි කීපයක් ආරම්භ කිරීම.

මුල් සභාවේ සත්‍ය විශ්වාසය ආරක්ෂා සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කිරීම.

(13 ශ්‍රේණිය 7.3 නිපුණතා මට්ටම)

ii. ශුද්ධවන්ත ජීවිතය හා පාලකයන් විස්තර කිරීම

තාපය ජීවිත ක්‍රමය

ඇඳහිල්ලේ ජීවිතය

ඔවුන්ගේ ඉගැන්වීම්, දේශනා මෙන්ම ලේඛනාකරණය තුලින් ඉදිරිපත් කළ ධර්මයේ නිරවද්‍යතාවය

ජීවිත වෙනස් කර ගැනීමෙන් .... (ආදී කරුණු ඇතුලත් කොට ගෙන සිසුවා ලියා ඇති කරුණු වලට ලකුණු ලබා දෙන්න.)

(ලකුණු 10 x 2 = 20 යි)

08. i. අධ්‍යාපනය සහ පාසල් රජයට පවරා ගැනීම. ක්‍රිස්තියානි ආගමියන් කෙරෙහි නිර්දය විවේචන

ජනවාර්ගික ගැටලුව සහ සාම ක්‍රියාදාමය බෙදිගිය කිතුනු ආගමික ව්‍යාපාර

(සිසුන් විස්තර කර ඇති කරුණු සලකා බලා ලකුණු දෙන්න.)

(ලකුණු 10) (13 ශ්‍රේණිය ගු.මා.129,130,131 පිටු)

ii. ආගමික සහජීවනය සඳහා සෑම ආගමකට ගරු කිරීම.

බහු ජාතීන් වෙසෙන රට තුල සෑම ජාතියක්ම සහෝදරත්වයෙන් පිළිගැනීම.

මහ ජාතීන් සුළු ජාතීන් කොට නොසලකා සැමදෙනාටම සමාන්ත්වයෙන් සැලකීම.

ආගමික හා ජාතික උත්සව වලදී සෑම ආගමකට හා ජාතියකට සම තැන ලබාදීම.

(මෙවන් කරුණු සිසුවා ලියා පෙන්වා දී ඇත්නම් ලකුණු ලබා දෙන්න.) (ලකුණු 10 x 2 = 20 යි)

එතුමාගේ අවසන් අවවාදය වුගේ 'කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළ නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේ දී ඉටුකර ගත නොහැකිය' යන්නය.

රෝගීන්ට උපස්ථාන කිරීම හා ප්‍රාතිහාර්ය කිරීම.

(මෙවැනි කරුන පෙන්වා දී ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

(13 ශ්‍රේණිය ගු.ම. පිටු 115, 116 ) (ලකුණු 10) (10 x 2 = 20)